**අධ්‍යාපන අමාත්‍යාංශය**

**ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ I ශ්‍රේණියේ නිලධාරීන් තනතුරුවලට පත් කිරීම - 2021**

2021.10.18 දිනැතිව අමාත්‍යාංශ නිල වෙබ් අඩවියේ පළ කරන ලද ශ්‍රී ලංකා ගුරු අධ්‍යාපනඥ සේවයේ I ශ්‍රේණියේ නිලධාරීන් පුරප්පාඩු වූ තනතුරු සඳහා පත් කිරීමේ නිවේදනය හා බැඳේ.

එම නිවේදනයේ උපලේඛන II හි ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ ලකුණු පටිපාටියේ අනු අංක 05. I රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අධ්‍යාපන සේවා කමිටුවේ අංක ESC/APP/SLTES/04/35/2021 හා 2021.12.15 දිනැති ලිපියෙන් ලබා දී ඇති තීරණය අනුව පහත පරිදි සංශෝධනය කරනු ලබන බව මෙයින් දැනුම් දෙමි.

05. **විෂයය බාහිර ක්‍රියාකාරකම් හා ජයග්‍රහණ :** **උපරිම ලකුණු 10**

I. ක්‍රීඩා/නාට්‍ය/කලා උළෙල හෝ බාලදක්ෂ/ශිෂ්‍යභට/ එඩින්බරෝ ආදී අවස්ථාවන්හි දී **ගුරු ශික්ෂණලාභීන් / ගුරු සිසුන්** මෙහෙයවා ලබා ගත් සාර්ථකත්වයන් සඳහා ලද ඇගයීම් /ප්‍රශංසා සහතික හෝ **ගුරු අධ්‍යාපන ක්ෂේත්‍රයේ** උන්නතිය වෙනුවෙන් කරන ලද නව නිර්මාණ / සුවිශේෂි දායකත්වයන් වෙනුවෙන් ලබා ගත් සහතික. - ලකුණු 08

[අධ්‍යාපන ලේකම්/ප්‍රධාන කොමසාරිස් විසින් නිකුත් කර ඇති හෝ රජයේ අනුබද්ධිත ආයතනයකින් හෝ රජයේ පිළිගත් ජාත්‍යන්තර ආයතනයකින් නිකුත් කරන ලද සහතික සඳහා (මෙහිදී තහවුරු කළ හැකි ලේඛන ඉදිරිපත් කළ යුතු අතර සම්මුඛ පරීක්ෂණ අවස්ථාවේ යම් අවිනිශ්චිතතාවයක් මතු වුව හොත් අදාළ ආයතන වලින් විමසා එම ලබා දෙන ලකුණු පිළිබඳ අවසාන තීරණයකට එළඹෙනු ඇත.)]

එක් සහතිකයකට ලකුණු 02 බැගින් උපරිම සහතික 04 ක් සඳහා ලකුණු ලබා දෙනු ලැබේ.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අධ්‍යාපන සේවා කමිටුවේ නියමය පරිදි.

මහාචාර්ය කේ. කපිල සී. කේ. පෙරේරා
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය
2021.12. 31